

# වයඹ, පෙර පාසල් ගුරු පුහුණු විදුහල

ඓතිහාසික හස්තිශෛල පුරවරයේ ළමා ලොව එළිය කරමින් නොනිමෙන පහනක් ලෙස දැල්වෙන, මනරම් පරිසරයක පිහිටි වයඹ පෙර පාසල් ගුරු පුහුණු විදුහල ඔබ අප සැමගේ සෙනෙහසේ නවාතැනකි.

**රටක මල් කැකුළු වූ පූර්ව ළමා වියෙහි දරුවා හෙට දිනයේ රට කරවන අයෝමය හස්තය වේ"** එසේ හෙයින් පූර්ව ළමා වියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම රටක ප්‍රධානතම වගකීම වන්නේ ය. එම භාරදූර වගකීම නිසි ලෙස අවබෝධ කරගත් වයඹ පළාත් සභාව 1994 වර්ෂයේ වයඹ පෙර පාසල් ගුරු පුහුණු විදුහල ස්ථාපනය කිරීම පූර්ව ළමා සංවර්ධනයේ දී ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් වන්නේ ය. තරුණ සේවා සභාව යටතේ ආරම්භ වූ මෙම ආයතනය, පළමුව මානව සම්පත් අධිකාරිය යටතට අනතුරුව වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යංශය යටතට ද පත් විය. 2003 අංක 04 දරන පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන ප්‍රඥප්තියට අනුව 2003 වසරේ අග භාගයේ දී මෙම ආයතනය පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යටතට පත් විය.

පූර්ව ළමා විය සංවර්ධනයේ ගුණාත්මක සංවර්ධනයක් අපේක්ෂාවෙන් ඇරඹුණ මෙම ආයතනය ගුරු පුහුණු අංශය සහ ආදර්ශ පෙර පාසල් අංශය වශයෙන් කොටස් දෙකකින් යුක්ත විය. මෙම අංශ දෙකෙහි ම ගුණාත්මක සංවර්ධනයට ආරම්භයේ සිට ම ජපන් අන්තර් ජාතික සහයෝගිතා ආයතනයේ තාක්ෂණික උපදෙස් හා මූල්‍යමය ආධාර ලැබුණි. 1994 - 2001 දක්වා ජපන් පෙර පාසල් උපදේශිකාවන් 11 දෙනෙකුගේ ක්‍රියාකාරී මඟ පෙන්වීමක් ආදර්ශ පෙර පාසලට ලැබුණ අතර ආදර්ශ පෙර පාසලේ ගුරු මහත්මීන් පස් දෙනකුට සහ ගුරු පුහුණු අංශයේ දේශකවරුන් තිදෙනකුට ජපන් විශ්ව



**විදුහල්පතිනිය**
**බී.එම්.එස්.වෛද්‍යතිලක මහත්මිය**

විද්‍යාලවල පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් ලබා දී ඇත.

1994 වසරේ දී ගුරු සිසුන් 17 දෙනකු එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව යටතේ පුහුණුවට ලක්කරමින් ආරම්භ වූ මෙම ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව හැදෑරූ ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව 1567 කි. 2003 වසරේ යුනිසෙෆ් ආයතනය දීප ව්‍යාප්තව කළ පෙර පාසල් තත්ත්ව සමීක්ෂණයේ දී වයඹ පළාත තුළ අ.පො.ස.(සා/පෙළ) විභාගය අසමත් පෙර පාසල් ගුරුවරුන් පුහුණුවකින් තොරව කටයුතු කරන බව පැහැදිලි වු නිසා ඒ අය සඳහා මාස හයක සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කරන ලදී.

එමෙන්ම මෙම ක්ෂේත්‍රයේ වැඩිදුර අධ්‍යාපනයට යොමු වීමට අභිලාශ ඇති සාර්ථකව ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ උසස් පෙළ සමත් ගුරු සිසුනට උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කරන ලදී. මෙම පුහුණුව සඳහා 2005 වසරේ දී ගුරු සිසුන් 30 කින් යුතු කණ්ඩායමක් ඇතුළත් වූ අතර මේ අය දෑ අවුරුද්දක කාලයක් පර්යේෂණාත්මකව අධ්‍යයන කටයුතුවල නිරත වේ. 2008 වසර වන විට පළාතේ සියලුම පෙර පාසල් ගුරුවරුන් පුහුණුවකට ලක් කිරීම ගුරු පුහුණු විදුහලට පවරා ඇත. ඒ අනුව 2006 වසරේ මෙම ආයතනය කේන්ද්‍ර කර ගනිමින් මහව නාත්තන්ඩිය සිංහල මාධ්‍යයෙන් ද පුත්තලම සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ද ගුරු පුහුණු ප්‍රාදේශීය මධ්‍යස්ථාන ආරම්භ විය.

## ආයතනයේ අරමුණු

* වයඹ පළාත් සභාව තුළ පෙර පාසල් ගුරුවරුන් විධිමත් පුහුණුවකට ලක් කිරීම හා පෙර පාසල් වෘත්තියට ඇතුළු වීමට අපේක්ෂිත අය කිරීම.
* ආයතනය තුළින් පිටව යන පුහුණු ඩිප්ලෝමා හා සහතික පත්‍ර ලාභීන් සංස්කරණ සම්මේලන සහ සේවාස්ථ සැසි මඟින් යාවත්කාලීන කරවීම.
* වයඹ පෙරපාසල් ගුරුවරුන් සම්බන්ධීකරණය කොට පොදු සැලැස්මක් යටතේ විධිමත් කරවීම.
* වෙනත් පළාත්වල ගුරු සංගම්වල ඉල්ලීම පරිදි සේවාස්ථ සැසි සහ සංස්කරණ සම්මේලන සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම.
* පූර්ව ළමා වියේ පසුවන දරුවන්ගේ දෙමාපියන් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම සහ උපදෙස් දීම
* පූර්ව ළමා විය පිළිබඳ ජාතික මට්ටමින් තොරතුරු ලබාදෙන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීම
* පූර්ව ළමා විය පිළිබඳ පර්යේෂණාත්මකව ක්‍රියාත්මක වීම සඳහාත් ගුරු පුහුණු අංශයේ පුහුණු කරවීමෙහි අවශ්‍යතාවන් සඳහාත් ආදර්ශ පෙර පාසල පවත්වාගෙන යාම.

මෙම අරමුණු මල්ඵල ගැන්වීම සඳහා මෙම ආයතනය, ගුරු පුහුණු අංශය හා ආදර්ශ පෙර පාසල් අංශය වශයෙන් කොටස් දෙකකින් ක්‍රියාත්මක වේ. මෙයට අමතරව 2004 වසරේ සිට වයඹ පළාත තුළ රාජ්‍ය සේවකයන්ගේ පූර්ව ළමා විය දරුවන් සඳහා දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ද ආරම්භ කොට ඇත.

මෙම ආයතනය තුළ සේවය කරන සමස්ත මානව සම්පත් 32 කින් සමන්විත වන අතර සේවය සලසන ආකාරය අනුව එම අංශ ද කොටස් 02 කට බෙදිය හැකිය. එනම් අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙසිනි. ගුරු පුහුණු පාඨමාලා සඳහා 11 දෙනකුගෙන් සමන්විත ප්‍රවීන දේශක මඬුල්ලක් සිටින අතර ආදර්ශ පෙර පාසල් අංශය ගුරු මහත්මීන් 10 දෙනකුගෙන් සමන්විත වේ. මෙයට අමතරව 11 දෙනකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් ද මෙහි අධ්‍යාපන සංවර්ධනය සඳහා සහය ලැබේ.

2004 වසරේ සිට වයඹ පළාත තුළ රාජ්‍ය සේවකයන්ගේ පූර්ව ළමා විය දරුවන් සඳහා දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ද ආරම්භ කොට ඇත. මෙම ආයතනය තුළ සේවය කරන සමස්ත මානව සම්පත් 32 කින් සමන්විත වන අතර සේවය සලසන ආකාරය අනුව එම අංශ ද කොටස් 02 කට බෙදිය හැකිය. එනම් අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙසිනි.



දැනට වයඹ පළාත් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය මඟින් පාලනය වන වයඹ පළාත් පෙර පාසල් ගුරු පුහුණු විදුහල රැස්වීම් ශාලා, දේශන ශාලා, පුස්තකාල පහසුකම්, නේවාසිකාගාර පහසුකම්, ආදී සියල්ලෙන් සමන්විත අංග සම්පූර්ණ විදුහලකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුගත වෙමින් වසරකට ව්‍යාපෘති 18 ක්‍රියාත්මක කරන ආදර්ශ පෙර පාසල පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධනයේ නියුක්ත වූවන්ට නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස සකස් කොට උපදේශන ක්‍රියාදාමයෙහි ද වර්තමානයේ නියැළෙයි. පෙර පාසල් ක්ෂේත්‍රයේ නියැලෙන අයට ජාතික මට්ටමේ පිළිගත් විධිමත් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වසරකට ගුරු සිසුන් 250 කට ඉල්ලුම් කළ හැකි ය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමට කැමති අය සඳහා පර්යේෂණාත්මකව අධ්‍යයන කාර්යයෙහි යෙදෙන දෑ අවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 50 දෙනකුට ඉල්ලුම් කළ හැකිය. උසස් පෙළ සමත් පිළිගත් ආයතනයක එක් අවුරුදු පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ අයට මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය. ඇතුගල්පුර සීමාවේ වැව් ඉස්මත්තේ සොබා දහමින් අනූන මනරම් භූමි භාගයක පිහිටා ඇති ළමා විශ්වවිද්‍යාලයයක් බඳු මධ්‍යස්ථානය තුළ සැබෑ ඉගෙනුම් අත්දැකීම් ලබමින් ඉගෙනුම් ක්‍රියාවලියේ නිරත වීමට අපේක්ෂා කරන අයට පහත සඳහන් දුරකථන අංකයෙන් හෝ ලිපිනයෙන් විමසිය හැකිය.

**දුරකථන අංක : 037 - 2225088**
**වයඹ පෙර පාසල් ගුරු පුහුණු විදුහල,**
**වෙලගෙදර උයන – කුරුණෑගල**

හස්තිශෛලපුර වැව ඉස්මත්තේ රමණීය භූමි භාගයක ඉතා දැකුම්කළු පරිසරයක ජපන් ගෘහ නිර්මාණ ශිල්පයට සහ ශ්‍රී ලංකාවට අවේණික පැරණි ගොඩනැගිලි කිහිපයකින් හා ළමා උද්‍යානයකින් සමන්විත වයඹ පෙර පාසල් ගුරු පුහුණු මධ්‍යස්ථානයට යා හැකි ගමන් මාර්ග කිහිපයකි.

කුරුණෑගල නගරයේ සිට පුත්තලම් මාර්ගය ඔස්සේ යන්තම්පලාවෙන් හැරී සුන්දරාපොල පාර ඔස්සේ දඹුල්ල පාරේ පොල්අත්තාපිටිය හංදියෙන් වැව පාර දිගේත්, රන්තලිය තානායම අසලින් වැව පාර දිගේත්, සකුරා පෙර පාසල් ගුරු පුහුණු මධ්‍යස්ථානයට ළඟා විය හැකිය. මෙම ප්‍රදේශය "වෙලගෙදර උයන" ලෙස නම් කර තිබේ.

ඉතා නිසංසල පරිසරයක පිහිටි මෙම ගුරු පුහුණු මධ්‍යස්ථානය මඟින් මේ වන විට වයඹ පළාතේ පෙර පාසල් ගුරුවරියන් විශාල ප්‍රමාණයක් පුහුණු කර තිබේ.

පාඨමාලා 05 ක් මෙහි පවත්වන අතර, වයඹ පළාතේ පෙර පාසල් 1400 ක් මේ වන විට ලියා පදිංචි කර, පළාත් සභාවේ සෘජු පාලනය යටතේ පවත්වා ගෙන යයි. ඒ සඳහා ප්‍රඥප්තියක් ද පාලන මණ්ඩලයක් ද පත් කර තිබේ. 1988 වර්ෂයේ දී තරුණ සේවා සභාව ජයිකා ආයතනය සමඟ එක්ව පෙර පාසල් අධ්‍යාපනය ආරම්භ කළ අතර, පළාත් සභා ක්‍රමයක් සමඟ පෙර පාසල් විෂය පළාත් සභාවට පැවරිණි. ඒ අනුව විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර පෙර පාසල් උපදේශකවරුන් හා ගුරුවරුන් ජපන් රටට යවා පුහුණු කර මෙම මධ්‍යස්ථානය ආරම්භ කර තිබේ.

මෙහිදී සියයට විසිපහක් ජයිකා ආයතනයද, පළාත් සභාව 75% ක් ද වැය කරමින් මෙම ආයතනය පවත්වා ගෙන යයි.

පළාත් සභාවක් පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් ආරම්භ කළ ප්‍රථම අවස්ථාව හා එකම ආයතනය මෙය වන අතර, පළාතින් පිට ගුරුවරුන් ද පුහුණු කිරීම දැන් ආරම්භ කර ඇත. දිවයිනේ විවිධ ආයතන මඟින් පවත්වා ගෙන යන පෙර පාසල්වල ගුරුවරියන් මෙහි පුහුණු කරන අතර, පළාත් සභා මඟින් ද පුහුණුව සඳහා පෙර පාසල් ගුරුවරුන් යොමු කරන බව වයඹ පළාත් ප්‍රධාන ලේකම් එම්.එම්.එන්.ඩී.බණ්ඩාර මහතා පැවසුවේය.

කුරුණෑගල දිස්ත්‍රික් සංචාරක

**ගුණරත්න ලියනආරච්චි**

